සමාජ සමීක්ෂා: සමාජීය විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රය
ISSN 2478-0472
http://www.socialaffair.org

# සමාජ විග්‍රහයේ විවිධ පැති

සිරි ගමගේ*
අධ්‍යාපන විද්‍යා පීඨය, නිව් ඉන්ග්ලන්ඩ් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව

## හැඳින්වීම

සමාජ විග්‍රහය යනු කුමක්ද? එහිදී අපි භාවිත කරන සංකල්ප හා විධික්‍රම කොතරම් දුරට අප සමාජයේ විශේෂතා හා යථාර්ථයට සමීපද? සමාජ විග්‍රහයේ යෙදීමට සමාජ විද්‍යා උපාධියක් අත්‍යවශ්‍යද? සමාජ විද්‍යාවේ යෙදෙන සමාජ විද්‍යාඥයෙකු සතු සමාජ වගකීම් මොනවාද?

පෙරදිග හා අපරදිග රටවල බිහි වී භාවිත වන සමාජ විද්‍යාව හා විග්‍රහ විධි දෙස බලන විට සිය න්‍යායාත්මක සංකල්ප හා විග්‍රහාත්මක විධි කෙරෙහි තමා සමාජයන්හි ඓතිහාසික මෙන්ම සමකාලීන සමාජ සංස්ථාවල ස්වරූපය, සමාජ ක්‍රියාවලීන් හා සමාජ ප්‍රශ්න ඉමහත් බලපෑමක් සිදුකොට තිබෙන බව පෙනේ. මේ අනුව ඕස්ට්‍රේලියානු සමාජ විද්‍යාඥයින්ගේ මූලික අවධානය යොමුව ඇත්තේ ඕස්ට්‍රේලියානු සමාජ ප්‍රශ්න අධ්‍යයනය කෙරෙහිය. මෙය කැනඩාව, ඇමෙරිකාව, එංගලන්තය, ජර්මනිය වැනි සංවර්ධිත රටවලට මෙන්ම ඉන්දියාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලටද සාධාරණ නිරීක්ෂණයකි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව වැනි රටවල භාවිත වන විධිමත් සමාජ විද්‍යාව දෙස බලන විට පැන නැගිය යුතු සාධාරණ ප්‍රශ්නයක් තිබේ. එනම් කොතරම් දුරට අපේ සමාජ විද්‍යාඥයන් බටහිර සංකල්ප න්‍යායාත්මක රාමු සහ විග්‍රහාත්මක විධිවල සිරකරුවන් බවට පත්ව තිබේද යන්නයි. එම ප්‍රශ්නයම වෙනත් ආකාරයකින් නැගුවොත් අපේ සමාජ විද්‍යාව කෙතරම් දුරට අප රටේ ඓතිහාසික, ආගමික, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික යථාර්ථයන්හි සූක්ෂමව පසුතල වී තිබේද? යන්නයි. මේ ප්‍රශ්නය කලකට පෙර ශ්‍රී ලාංකීක සමාජ විද්‍යාඥයින් විසින් සාකච්ඡාවට ලක් කරන ලද ශ්‍රී ලාංකික සමාජ විද්‍යාවක් තිබේද? යන ප්‍රශ්නයටද ළඟින් සම්බන්ධවේ.

## සමාජ විද්‍යාවේ අරමුණ

සමාජ විද්‍යාවේ අරමුණ සමාජ විග්‍රහය (Social Analysis) විය යුතු බවට කිසිවෙකු විරුද්ධවනු නැත. නමුත් කුමන ආකාරයක සමාජ විග්‍රහයක් අප රටට ගැළපේද යන්න පිළිබඳ නම් විවිධ මතවාද තර්ක විතර්ක තිබිය හැකිය. මේ ප්‍රශ්නය තවත් ළඟින් විමර්ශනය කර බලමු. ප්‍රශ්න රාශියක අනුසාරයෙන් එය කරමි.

අ. සමාජ විග්‍රහයේ යෙදෙන්නේ සමාජ විද්‍යාඥයින් පමණක්ද? ඒ සඳහා සමාජ විද්‍යා

*කර්තෘ විද්‍යුත් ලිපිනය:sgamag2@une.edu.au

© සමාජ සමීක්ෂා. This work is licensed under a Creative Commons Attribution-Non Commercial 4.0 International License.

උපාධියක් අත්‍යාවශ්‍යද?

මේ ප්‍රශ්න දෙකටම මා නම් දෙනුයේ නැත යන පිළිතුරයි. ඉතිහාසඥයින්, දේශපාලන විද්‍යාඥයන්, අධ්‍යාපන විශේෂඥයන්, කලා විශේෂඥයන් යනදීන්ද සමාජ විග්‍රහයේ යෙදේ. අපේ සමාජයේ නගර නගරාන්තවල ගම් නියම් ගම්වල ජීවත්වන සමහර පුද්ගලයන් දෙස බලන විට සමාජයේ විවිධ අංග පිළිබඳ පෘථුල දැනුමක් හා විචක්ෂණ ඥාන ශක්තියක්ද ඇතිබව ඔබට පෙනෙනු ඇත. මෙයින් වැඩි දෙනෙකු සමාජ විද්‍යා උපාධි දරන්නෝ නොවේ. උදාහරණයක් ලෙස මා දන්නා එක්තරා වැඩිමහලු පුද්ගලයෙකු බුදු දහමේ ගැඹුරු පැති ඉතා සරල ලෙස විග්‍රහ කිරීමේ අතිමහත් දක්ෂතාවයක් ඇති කෙනෙකි. ඔහු සාමාන්‍ය ගැමි ජීවිතයක් ගත කරන පුද්ගලයෙකි. කඩුගන්නාවේ ඌරාපොල මා පර්යේෂණ කරන කාලයේ හමුවූ තරුණයන් දෙදෙනෙකුට සමාජ විද්‍යාවේදී කථා කරන 'මානව විද්‍යාත්මක අන්තරාවලෝකන' (Anthropological Insights) තිබීම ඇති බව තේරුම් ගැනීමට මට වැඩි කලක් ගියේ නැත. අධ්‍යාපන උසස් පෙළ හා පිරිවෙන් විභාගවලට සූදානම් වෙමින් සිටි මේ තරුණයන් දෙදෙනා විශ්ව සාහිත්‍ය කෘතීන් මනාව කියවා, දැනුමක් අයත් කරගෙන සිටියවුන් බවද මට තහවුරු විය. ඌරාපොල ගම පිළිබඳ ඔවුන් සිය අත්දැකීම් තුළින් කරන ලද විග්‍රහයන් මනාව සංකලනය කළ අදහස් හා මතවලින් ගහන විය.

(ආ) සමාජ විග්‍රහයේ යෙදෙන සමාජ විද්‍යාඥයා (වචනයේ පුළුල් අර්ථයෙන් ගත් කල) සැලකිල්ලට ගත යුතු කරුණු මොනවාද?

කලින් සඳහන් කළ පරිදි සමාජ සංස්ථා, ඒවායේ ව්‍යුහය වෙනස්වීම්, ඒවාට බලපාන හේතු, ඒවායේ ප්‍රතිඵල ආදී කරුණු රැසකි. නිදසුනක් ලෙස පසුගිය දශක දෙක තුළ අපේ දේශපාලන සංස්ථාවේ සිදුව ඇති වෙනස්වීම් (බාහිර හා අභ්‍යන්තර) හා ඒවායේ ප්‍රතිඵල හා හේතු විග්‍රහයක යෙදේ නම් අපට ඉමහත් 'කරුණු' සම්භාරයක් සැලකිල්ලට ගැනීමට සිදුවේ. මේවා අතර අපේ සාම්ප්‍රදායික පක්ෂ ක්‍රමය, එහි තීරණ ගන්නා ආකාරය, එහි ව්‍යුහය, නව පක්ෂ හා ඒවායේ ව්‍යුහය, තීරණ ගන්නා ආකාරය, මේ පක්ෂවල මහජන පදනම, නායකත්ව රටා, ඡන්දවලට මුහුණ දෙන ආකාරය යනාදිය මින් සමහර කරුණුය. ජනාධිපති ක්‍රමය හා පාර්ලිමේන්තු ක්‍රමය අතර අනුබද්ධිත විෂමතා තවත් කරුණු රැසකි. බලයට පත්වන පක්ෂ හා ඒවායේ නායකයන් සැබෑ මහජන නියෝජිතයන්ද යන්න තවත් කරුණකි. එසේම අපගේ දේශපාලන ක්‍රමය කොතරම් දුරට සාර්ථක නියෝජන ක්‍රමයක්ද (Representative System) යන්න තවත් කරුණකි. මෙහි අනෙක් පැත්ත වනුයේ සහභාගී ක්‍රමයයි (Participation System). දෙවැනි ක්‍රමය යටතේ මහජන ඡන්ද දෙකක් අතරතුරදීද රජයක් විසින් ගනු ලබන තීරණ සඳහා මහජනයාගේ අදහස් උදහස් විමසා බැලීම විශේෂයකි. මෙය විවිධ කොමිෂන් සභා පර්යේෂණ ප්‍රතිසංස්කරණ යනාදිය මගින් සිදුකරනු ලැබේ.

රටේ කුමන පන්තීන්වලට අයත් පුද්ගලයන් කුමන පක්ෂයක වැඩිපුර නියෝජනය වේද? යන්න තවත් ප්‍රශ්නයකි. රටේ විවිධ ප්‍රභූ කොටස් යම් පක්ෂයක් බලයට පත්වූ විට විශේෂ වරප්‍රසාද ලබනවාද? පහළ පන්තීන්ට අයත් පුද්ගලයන්ගේ හඬ නියෝජනය වන යම් පක්ෂයක් තිබේද? ප්‍රධාන පක්ෂ කොළඹ ප්‍රභූ පන්ති පදනම් කරගත් ඒවාද? දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා මේ පක්ෂ අනික් පන්තීන්ට අයත් පුද්ගලයන්ගෙන් කොටසක් සිය පක්ෂවල තීරණාත්මක කොමිටිවලට ඇතුළු කර ගන්නවාද? උතුරේ ද්‍රවිඩ ව්‍යාපාරයත් දකුණේ ජනතා විමුක්ති පෙරමුණු ව්‍යාපාරයත් මේ ප්‍රභූවාදී දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රතිඵලද?

මේ ආකාරයට විවිධ ප්‍රශ්න පැන නගිමින් දේශපාලන සංස්ථාව පිළිබඳ විග්‍රහයක යෙදෙන්නා සිය විග්‍රහය කරනු ඇත. අනික් කුමන සංස්ථාවක් ගත්තද මෙවැනි අදාළ ප්‍රශ්න පැනනගිමින් සිය විග්‍රහය කළ යුතුව ඇත.

තවත් උදාහරණයක් ලෙස රටේ ආර්ථික ක්‍රමය ගතහොත් පහත සඳහන් ප්‍රශ්න නැගිය හැක.

- නව ආර්ථික ක්‍රමය කොතරම් දුරට ආසියාවේ අනිකුත් රටවල් හා ලෝකයේ දියුණු රටවල් සමඟ අනුබද්ධව තිබේද? (Interpretation)
- ආර්ථික විග්‍රහයේදී අප රටට කුමන

ආකාරයේ ශුභවාදී හා අශුභවාදී ප්‍රතිඵල ගෙන එයිද?

- මුදල් හා ධනය ඉපැයීමම අප ආර්ථික ක්‍රමයේ ප්‍රධාන අරමුණව තිබේද?
- මෙවැනි ආර්ථික ක්‍රමයක් යටතේ කුමන ආකාරයේ සමාජ සාරධර්ම රටේ පතුරුවා හැර තිබේද?
- රටේ සමාජ සංවිධානයේ අනිකුත් අංශවල (උදා:- නිලබල ක්‍රමය, පරිවාහන ක්‍රමය, අධ්‍යාපන ක්‍රමයක් සංස්කෘතිය) බිඳවැටීමක් මෙම ඒකීය ආර්ථික අවධානය නිසා සිදුව තිබේද?
- විවෘත වෙළඳපොල ආර්ථික ක්‍රමයක් (Free Market Economy) ක්‍රියාත්මක කිරීම නිසා සමාජ සහනශීලි රාජ්‍යය (Welfare State) බිඳ වැටී තිබේද? ඒ වෙනුවට පවතින රාජ්‍ය කොතෙක් දුරට අන්තර් ජාතික අධාර සපයන ආයතනවල රබර් සීල් එකක් බවට පත්ව තිබේද?
- නව ධනවාදී ආර්ථික සම්බන්ධතා කොතෙක් දුරට මානුෂික සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා උපකාර වේද? එනම් රැකියා සපයන්නන් හා රැකියා කරන්නන් අතර සම්බන්ධය හුදෙක් මූල්‍යමය සම්බන්ධයන් පමණක් දක්වා අඩු වී තිබේද?
- රටේ අධ්‍යාපන ක්‍රමය හා ආර්ථික ක්‍රමය අතර කුමන බද්ධ ශ්‍රදානයක් තිබේද? අධ්‍යාපන ක්‍රමය මගින් බිහිකරන උපාධිධාරීන් ආර්ථික ක්‍රමයට ඇතුළු කරගැනීමට ඇති බාධා මොනවාද?

මේ ආකාරයට ආර්ථික සංස්ථාව පිළිබඳ නැගිය හැකි ප්‍රශ්න ලැයිස්තුව ඉතා දීර්ඝ එකකි. සමාජ විග්‍රහයේදී තමා අධ්‍යාපනය කිරීමට අදහස් කරන විෂය පිළිබඳ විවිධාකාර ප්‍රශ්න නැගීම මුලදීම කළයුතු කාර්යයකි. අධ්‍යාපන විග්‍රයක් සඳහා මෙසේ නගන ලද ප්‍රශ්න සියල්ලම හෝ ඉන් තෝරාගත් ප්‍රශ්න කිහිපයක් පමණක් යොදාගනු ලැබේ. සිය පර්යේෂණ තුළින් රටේ සිදුවන සැබෑ සිදුවීම් පිළිබඳ මනා අවබෝධයක් ලබාගන්නා සමාජ විද්‍යාඥයා අනතුරුව තමා නගන ලද ප්‍රශ්නවලට කරුණු පදනම් කරගත් පිළිතුරු සපයනු ඇත.

- සමාජ සිදුවීම් (Events/Phenomena) සහ සමාජ ක්‍රියාවලීන් (Processes) පිළිබඳ ළඟින් නිරීක්ෂණය කර අවබෝධයක් ලබා ගැනීමකින් තොරව අලුතින් යමක් කීමට සමාජ විද්‍යාඥයා අපොහොසත් වේ. යමෙකු එය කරීමට උත්සාහ කළහොත් ඔහු ව්‍යාජ සමාජ විද්‍යා වහරේ යෙදෙන්නකු ලෙස නමක් සදාගනු ඇත. රටේ සිදුවන විවිධ ක්‍රියාවලීන් හා සිදුවීම් පදනම් කරගෙන සිය මත ප්‍රකාශ කරන විග්‍රයක යෙදෙන සමාජ විද්‍යාඥයාට සැබවින්ම වැඩිපුර ගෞරවයක් ලැබෙනු ඇත. මෙවැනි ක්‍රියාවලීන් හා සිදුවීම් සොයාගැනීම එවැන්නාගේ පර්යේෂණ කාර්යයන්හි මූලික අරමුණක් වේ.
- නිදසුනක් ලෙස සමාජ සංකේත (Symbols) දෙස බලමු . ධනය, බලය හා තත්ත්වය හැඟවෙන සංකේත මේ අතර වේ. ඓතිහාසිකව කිසියම් සන්දර්භයක ක්‍රියාත්මකව භාවිත වූ කිසියම් සංකේතයක් කාලයාගේ ඇවෑමෙන් වර්තමානය දක්වා පැවැත ඒමෙන් ඒවා අපේ විසිත්ත කාමරවල අලංකරණ අංශයක් ලෙස පවතිනවා විය හැකිය (නිදසුන් ලෙස සූර්ය සංකේතය, මුරායුධ, සේසත්, පිත්තල පහන). ජාතික ඇඳුමේ විවිධ මුහුණුවර මෙහිදී අවධානයට ලක් කළ හැකි තවත් අංගයකි. පැජරෝ, ඉන්ටර්කූලර් ජීප් රථය ධනය හා බලය මෙන්ම තත්ත්වයද හැඟවෙන සංකේතයක් බවට පත්ව ඇත. රටේ දේශපාලන හා ව්‍යාපාරික ප්‍රභූන් අතර මූලික සංකේතයක් බවට එම ජීප් රථය පත්ව ඇති අතර ග්‍රාමීයව හා නගරවල ද සුළු ධනපති පන්තිය අතර ජපානයෙන් ගෙන්වන ලද හයිඑස් මගී ප්‍රවාහන රථයද මෝටර් බයිසිකලයද සංකේතයක් බවට

පත්ව ඇත.

රජය හා ඊට අනුබද්ධ ආයතන හා පුද්ගලයන් විසින්ද සංකේත නිපදවනු ලැබේ. සුදු නෙලුම් මල් ව්‍යාපාරයේදී භාවිතයට ගන්නා නෙලුම් මල මෙසේ සැලකිල්ලට ගතයුතු සංකේතයකි. රටේ දිළිදු කොටස් වෙත රජයෙන් පැමිණෙන සහනාධාර සංකේතවත් කිරීමේදී ආගමික සංකේතයක්ව පවතින නෙලුම් මල් යොදා ගැනීමේ යටි අර්ථය කුමක් දැයි විචක්ෂණව කල්පනා කරන සමාජ විද්‍යාඥයා සිතනු ඇත. කුකුල්මස් නැති දහවල් ආහාරයක් දානයකට සුදුසු නොවේද? කෙලවල් මාලු හෝ තලපත් මාලු වැනි දානයක් නියම දානයක් නොවේද? කිරි පැණි වෙනුවට අයිස් ක්‍රීම්ද ෆෲට් සැලඩ්ද අනු ආහාර බවට පත්ව තිබේද? තනි තට්ටුවේ ගෙයක් වෙනුවට තට්ටු දෙකක ගෙයක් සෑදීම තවත් ක්‍රියාවකි. මේ යනාදී ලෙස විවිධ ප්‍රශ්න නගමින් සමාජයේ සංකේතාත්මකව ඇතිවන වෙනස්කම් පිළිබඳ සමාජ හා මානව විද්‍යාඥයින් සිය අවධානය යොමු කරනු ඇත.

(ඇ) සමාජ විග්‍රහයේ යෙදෙන සමාජ විද්‍යාඥයා සතු සමාජ වගකීම් මොනවාද?

සිය සමාජ ආශ්‍රය හා විධිමත් අධ්‍යාපනය තුළින් උසස් මනසක් හා විචක්ෂණ දක්ෂතා දියුණු කර ගත් සමාජ විද්‍යාඥයා සතු වගකීම නම් තමා අධ්‍යයනය කරනු ලබන සමාජ සංසිද්ධීන්, ක්‍රියාවලිය හා ප්‍රශ්න පිළිබඳ සැබෑ විග්‍රහයක යෙදීමයි. එනම් ඒවා පිළිබඳ සත්‍යය හෙළිදරව් කිරීමයි. මෙහිදී ඔහු සිය වෘත්තියේ සීමා කම්වලට පමණක් යටත්ව අධ්‍යාපනයේ යෙදෙනු ඇත. දේශපාලන හෝ ආර්ථික හෝ වෙනත් කරුණුවලින් හෝ සීමා නොවනු ඇත.

ගරා වැටෙන සමාජ සංවිධානයක් හා සංස්කෘතියක් සහිත රටක නම් සමාජ විද්‍යාඥයා සතු වගකීම තවත් වැදගත්වනු ඇත. මෙහිදී බහු යථාර්ථවාදී සමාජ විග්‍රහයේ යෙදෙන්නවුන් පමණක් නොව සමාජ ප්‍රතිසංවිධානය (Social Reform) සඳහා අවශ්‍ය යෝජනා මාලාවක්ද ඉදිරිපත් කරනු ඇත. තවත් ඉදිරි පියවරක් ලෙස ඒවා ක්‍රියාත්මක කිරීමේ සැලසුමක්ද (Action plan) ඉදිරිපත් කොට එම අංශ පිළිබඳ කරුණු වටහා දීමේ ව්‍යාපාරවලද යෙදෙනු ඇත. මේ ආකාරයට වර්තමාන සමාජ විද්‍යාඥයා තමා ජීවත්වන සමාජයට හා එහි ප්‍රශ්නවලට ඉතා ළඟින් සම්බන්ධවී එම ප්‍රශ්නවලින් බැටකමින් ජීවත්වන සමාජ කොටස්වල සිතුම් පැතුම් හා අත්දැකීම් පිළිබඳ මනා අවබෝධයක් ලබාගෙන ඔවුනට විමුක්තියක් ලබාදීමේ විවිධ පියවරවලට ක්‍රියාශීලීව සම්බන්ධ වනු ඇත.

(ඈ) මේ කාර්යේදී කොතරම් දුරට බටහිර සමාජ සංකල්ප හා විධිවේද බාධකයක් හෝ අනුකරණයක් වේද?

මෙය රඳා පවතින්නේ ඔහු මේ සංකල්ප පිළිබඳ යථා අවබෝධයක් ලබා ඒවායින් නිරූපණය වන සමාජ යථාර්ථය හා සන්දර්භය පිළිබඳවද මනා අවබෝධයක් ලබා ඒවා සිය රටට ගැළපෙන හෝ නොගැළපෙන ආකාරය පිළිබඳ විග්‍රහයක යෙදීමෙන් අනතුරුව ඒ සංකල්ප සිය විග්‍රහයන් සඳහා යොදාගන්නවාද නැද්ද යන්න මතයි. හුදෙක් මේ සංකල්ප ගිරවුන් මෙන් අනුකරණාත්මකව මන්ත්‍රයක ස්වරූපයෙන් ඉගෙනීමෙන් හෝ ඉගැන්වීමෙන් සමාජ විද්‍යාවට අනර්ථයක් මිස සේවයක් නම් සිදු නොවේ.

කිසියම් සමාජ අංශයක් විග්‍රහ කිරීමේදී කුමන සංකල්ප භාවිත කරනවාද යන්න පිළිබඳවද සමාජ විද්‍යාඥයාට තීරණයක් ගැනීමට සිදුවේ. උදාහරණයක් ලෙස ගත් කළ අපේ ග්‍රාමීය සමාජයේ දේශපාලන ක්‍රියාවලීන් විග්‍රහ කිරීමේදී පන්තිය (Class), කල්ලිය (Faction), පක්ෂය (Party), ග්‍රාමීය ප්‍රජාව (village community) යන සංකල්පවලින් කුමක් වඩාත් ප්‍රයෝජනවත්වේද යන්න තීරණය කිරීමට සමාජ විද්‍යාඥයාට සිදුවේ. ධීවර සමූහයක් අධ්‍යයනය කළ පෝල් ඇලෙක්සැන්ඩර් Faction (කල්ලිය) යන සංකල්පය යොදාගත් අතර සිල්වා, හෙට්ටිගේ, ගමගේ යනාදීන් සිය විග්‍රහයන්හිදී පන්තිය යොදා ගත්තේ ය. කල්ලියකදී විවිධ පන්තිවලට අයත් පුද්ගලයන් ඊට අයත්වේ. ග්‍රාමීය ප්‍රජාව දේශපාලන පක්ෂ හා කුලවලටද පන්තින්වලටද අනුව ස්ථිරගත වී තිබිය හැකිය. නමුත් දෙන ලද අවධියක යම් ගම්මානයක ජනයා දේශපාලනිකව ක්‍රියාත්මක වූ ආකාරය දෙස බලන විට පන්තියට වඩා කල්ලිය වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

එය තීරණාය වනුයේ එම ජනයා, පන්ති වශයෙන් හෝ කල්ලිය වශයෙන් ක්‍රියාත්මක වේද? නැද්ද? යන්න අනුවය.

(ඉ) සිය පර්යේෂණ සඳහා මාතෘකා තෝරාග න්නේ කෙසේද? එහිදී කුමන සීමා තිබේද?

මෙය බෙහෙවින්ම පෞද්ගලික කාරණයකි. සිය රැකියාවේ අවශ්‍යතා තමාට ලැබෙන පර්යේෂණ කාලය හා මුල්‍යමය සහය, තෝරාගන්නා මාතෘකාව පිළිබඳ පෞද්ගලික ආශාවක් තිබේද? එය කොතරම් දුරට මහජනයාට ප්‍රශ්නයක් බවට පත්ව තිබේද? සිය රටේ රජය හා අනෙකුත් ජාතික හා අන්තර් ජාතික ආධාර සපයන ආයතනවල එම මාතෘකා පිළිබඳ අවධානයක් තිබේද යනාදී කරුණු මෙහිදී බලපායි.

උ.දා.: විවෘත ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක වීමේදී සමාජයේ සාරධර්මවල විකෘතිතාවන් ඇතිවී තිබේද? වැනි මාතෘකාවක් පිළිබඳ ගවේශනය කිරීම සමාජ විද්‍යාඥයින්ගේ යුතුකමකි. ආර්ථික විද්‍යාඥයන්ගේ මතය බෙහෙවින්ම යොමුවන්නේ එම ආර්ථික ක්‍රමය තව තවත් කාර්යාක්ෂමව ක්‍රියාත්මක කරගැනීමට ඇති බාධා ඉවත් කරගන්නේ කෙසේද? යන්න පිළිබඳවයි. අප සමාජය ඒකීය සංවිධානයක් යටතේ ක්‍රියාත්මක වීමේදී අප සමාජයේ ක්‍රියාත්මකව පැවැති පාරම්පරික සාරධර්ම සිරිත් විරිත්වලින් ඉමහත් සේවයක් ඉටුවිය. ලාභය ප්‍රමුඛ කරගත් ආර්ථික ක්‍රමයකින් පාරම්පරික සාරධර්ම විනාශවීම අරුමයක් නොවේ.

කුමන ක්‍රමයකින් හෝ මුදල් හා ධනය දේපළ උපයාගත යුතුය යන සාරධර්මය මිනිසුන්ගේ එදිනෙදා සිතුම් පැතුම් හා ජීවන ක්‍රියාවලින් තුළට අපරිමිත පරිද්දෙන් කා වැදී තිබෙනු දක්නට ලැබේ. ළමයින්ගේ අධ්‍යාපනය, අනාගතය, ගතිගුණ ආකල්ප දියුණු කිරීම හා සමාජයට යහපත් පුරවැසියෙකු බිහි කිරීම වැනි අධිෂ්ඨාන සමාජය තුළින් ගිලිහී ගොස් ඇති බවක් පෙනේ. උගත්කමට හෝ දක්ෂතාවයට (ගුරුවරයාට) සමාජයෙන් ලැබෙන ගෞරවය මුදලාලි කෙනෙකුට හෝ පොලිස් සාජන්ට් කෙනෙකුට ලැබෙන ගෞරවයට වඩා අඩු බව පැහැදිලි කරුණකි.

මේ වැනි ප්‍රවණතා නිසා සමාජයට දිගුකාලීනව ඇතිවිය හැකි ප්‍රතිවිපාක පිළිබඳ ගවේශනය කිරීම සමාජ විද්‍යාඥයාගේ යුතුකමකි.

සමාජ විද්‍යාඥයින් සිය සමාජයට තමාගෙන් ඉටුවිය යුතු වගකීම හා යුතුකම් දෙස පමණක් බලා සමාජ විග්‍රහයේ යෙදෙනු දක්නට ලැබේ. මෙවැන්නන් බෙහෙවින්ම සමාජ ප්‍රශ්නවලට ලක්වී දුක් විඳින සමාජ කොටස් කෙරෙහි අනුකම්පාවක් හා අනන්‍යතාවයක් ඇතිකරගෙන කටයුතුවල යෙදෙනු ඇත. වෙනත් වචනයෙන් කිවහොත් සමාජ විග්‍රහයේ යෙදෙන සමාජ විද්‍යාඥයින් විවිධ පසුතල තුළින් බිහිවන පුද්ගලයන්ය. රැකියා ඇති නැති, විදේශ අධ්‍යාපනයක් ලැබූ නොලැබූ, උපාධියක් කළ නොකළ, පීඩනයට ලක්ව ඇති සමාජ කොටස් කෙරෙහි ලෙන්ගතුතමක් හා අනන්‍යතාවක් ඇති නැති, බටහිර සමාජ විද්‍යා සංකල්ප අන්ධානුකරණයෙන් අනුකරණය කරන නොකරන, සිය රටේ ආගම, සංස්කෘතිය හා සමාජ සංවිධානය පිළිබඳ මුල් දැනුමක් ඇති නැති යනාදී වශයෙන් මේ පසුතල විවිධාකාර වේ.

මේ සාකච්ඡාවට අනුව පෙනීයන දෙයක් නම් සමාජ විග්‍රහය ඉතා සංකීර්ණ එහෙත් ඉතාමත් අවශ්‍ය සමාජ ප්‍රතිසංවිධාන පියවරක් වන බවයි. සමාජ විද්‍යාව ඉගෙනීමේ යෙදී සිටින සිසුන් වශයෙන් බලන විට එය හුදෙක් රැකියාවක් සඳහාම යොමුවූ උපාධි පාඨමාලාවක් ලෙසට වඩා ඊට වඩා පුළුල්වූ සමාජ හා දේශපාලන අර්ථයක් සහිත සිය ජීවතයට අදාළ වන්නාවූ කාර්යභාරයක් ලෙස තේරුම් ගෙන ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ. සමාජ විග්‍රහය විවිධ සමාජ සංස්ථා පිළිබඳවද සමාජ සිදුවීම් හා ක්‍රියාවලිය මෙන්ම සමාජ ප්‍රශ්න පිළිබඳවද සිදු කෙරේ. ශ්‍රී ලාංකික සමාජ විද්‍යාවේ විශේෂත්වයක් ඇතිවීමට නම් අප උගන්වන ඉගෙනගන්නා සමාජ විද්‍යා අදහස් සංකල්ප න්‍යායයන් හා විධික්‍රම අප සමාජ සන්දර්භයේ විශේෂතාවලට අනුකූලව හා ඒවා මත පදනම් වූ ඒවා බවට පත්විය යුතුව ඇත. බටහිර සංකල්පවල සිරකරුවන් වී ශ්‍රී ලාංකික සමාජ විද්‍යාවක් ගොඩනැගීම අපහසු කාර්යයක් වනවා පමණක් නොව රටේ ප්‍රගතියට හා පීඩනයට ලක්වන සමාජ කොටස්වල විමුක්තියටද අතහිත දෙන්නක් නොවනු ඇත.

මේ අදහස්වල මූලික කාර්යය නම් වර්තමාන සමාජ විග්‍රහයේ යෙදෙන අය, භාවිත කරන උපකරණවල ගැළපීම හෝ නොගැළපීම පිළිබඳ යථා අවබෝධයකින් සිය කාර්යයේ යෙදිය යුතු බවයි. හොඳ සමාජ විද්‍යාඥයා හොඳ සමාජ ගවේශකයෙකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Sarantakos, S. (2013). *Social Research*. Basingstoke: Palgrave Macmillan.

Suarez-Orozco, M.M. (2007). *Learning in the Global Era: International Perspectives on Globalization and Education*. Berkley: University of California press.

Torres,C.A. (2009). *Globalizations and Education: Collected essays on class, race,gender, and the state.* Columbia: Teachers College press, Columbia University.